විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: **04/2013 (සංශෝධන IV)**

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2022.04. 29

සියලුම බැංකු සාමාන්‍යාධිකාරිවරුන් වෙත

**විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ම විසින් නිකුත් කරන ලද 2013.10.29, 2014.12.12, 2015.05.05 හා 2021.12.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2013, 04/2013(I), 04/2013(II) හා 04/2013(III) බැලේ.

02. රජයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගනු ලැබූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශ්‍රාම වැටුපක් හිමි ගන්වනු ලබන්නේ, ඔවුන්ගේ වැඩිහිටි ජීවිත කාලය තුළ ඉහළ ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය ආදායම් තත්ත්වයක් තහවුරු කිරීමට ය. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2013 අනුව, විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගොස් විශ්‍රාමිකයන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හා ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහා විශ්‍රාමිකයන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත්තේ ද ඉහත අරමුණු ප්‍රමුඛ කොටගෙන ය.

03. ඇතැම් බැංකු විසින් විශ්‍රාමිකයන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමේදී මාසික විශ්‍රාම වැටුපෙන් විශාල කොටසක් ණය වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කරන බව වාර්තා වී ඇත. එම තත්ත්වය කඩිනමින් නිවැරදි කළ යුතුව පවතී. ඒ අනුව, විශ්‍රාමිකයන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමේ දී විශ්‍රාමිකයන්ගේ මාසික විශ්‍රාම වැටුපෙන් 60% ක උපරිම අවකරණ සීමාවකට යටත්ව, ණය වාරික අය කළ යුතුය. මෙම තීරණය 2022.06.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.

04. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2022 අනුව, 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනයට අදාළ කර නොගන්නා රුපියල් 5,000.00 ක මාසික දීමනාවක් සියලු විශ්‍රාමිකයන් වෙත ගෙවීම සඳහා කටයුතු කර ඇති අතර, විශ්‍රාමිකයන් වෙත ණය ලබාදීමේදී මෙම දීමනාව අදාළ කර නොගත යුතු බව වැඩිදුරටත් දන්වමි.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 3. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 4. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 5. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 6. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 7. | විගණකාධිපති | - අවශ්‍ය කටයුතු සඳහා |